ජනපතිගේ දූෂණ විරෝධී වැඩසටහන ඉන්දිය මහකොමසාරිස්ගේ ඇගයීමට

උපාලි කරුණාරත්න,
ජයසිරි මුණසිංහ



ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ දූෂණ විරෝධී වැඩසටහන මෙරට ඉන්දිය මහකොමසාරිස්වරයාගේ ඇගයීමට ලක්වේ. ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් සන් තෝෂ් ජා මහතා (Santosh Jha) අතර හමුවක් ඊයේ (02) ජනාධිපති කාර්යාලයේදී සිදු විය.

පසුගිය ජනාධිපතිවරණයෙන් අනුර කුමාර දිසානායක මහතා ලබාගත් ජයග්‍රහණය වෙනුවෙන් සිය හෘදයාංගම සුබපැතුම් පළ කළ ඉන්දීය මහකොමසාරිස්වරයා ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට හැකි සෑම ආකාරයකින්ම සහාය දැක්වීමට ඉන්දියාව සූදානමින් සිටින බවත්, ශ්‍රී ලංකාව කලාපයේ සාමකামී සහ ස්ථාවර රාජ්‍යයක් ලෙස ඉස්මතු වනු දැකීම සිය රටේ ප්‍රාර්ථනාව බවත් ප්‍රකාශ කළේය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගු කාලීන මිත්‍රත්වය සහ සමීපතාව සිහිපත් කළ ඉන්දීය මහකොමසාරිස්වරයා අසල්වැසි සහෝදර රාජ්‍යයන් ලෙස දෙරට අතර අඛණ්ඩ සහ ස්ථාවර මිත්‍රත්වයක් පවත්වා ගනිමින් ඉදිරියට යෑමේ වැදගත්කම අවධාරණය කළේය.

විශේෂයෙන්ම දූෂණයට එරෙහිව ඵලදායි ලෙස සටන් කිරීම සඳහා රාජ්‍ය පද්ධතිවල ඩිජිටල්කරණයේ වැදගත්කම පෙන්වාදුන් ඉන්දීය මහකොමසාරිස්වරයා, ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති දූෂණ විරෝධී වැඩපිළිවෙළ ද අගය කළේය. එසේම ඩිජිටල්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවට සහාය වීමට ඉන්දියාව කැමැත්තෙන් පසුවන බව ද මහකොමසාරිස්වරයා සඳහන් කළේය.

නිවැරදි රාජ්‍ය පාලනයක් බිහි කිරීමට ජනපති දරන වෑයමට පූර්ණ සහාය දෙන බව ජපාන තානාපති සහතික වෙයි



දූෂණයෙන් තොර සහ නිවැරදි රාජ්‍ය පාලනයක් බිහි කිරීමට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ගෙන යන වැඩපිළිවෙළට ජපාන රජයේ පූර්ණ සහාය ලබා දෙන බව ශ්‍රී ලංකාවේ ජපාන තානාපති මිසුකොෂි හිදෙයාකි (Mizukoshi Hideaki) මහතා පැවසීය.

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති මිසුකොෂි හිදෙයාකි (Mizukoshi Hideaki) අතර හමුවක් ඊයේ (02) ජනාධිපති කාර්යාලයේදී සිදු වූ අතර එහිදී තානාපතිවරයා එසේ පැවසීය.

ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ අනුර කුමාර දිසානායක මහතා වෙත සිය උණුසුම් සුබපැතුම් පිළිගැන්වූ ජපාන තානාපතිවරයා, ජපානය සහ ශ්‍රී ලංකාව අතර පවතින දිගුකාලීන සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීමට ජපාන රජය කැපවී සිටින බව ද සඳහන් කළේය.

දෙරටම අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර පිළිබඳව ද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුණු අතර, ඉදිරියේදී දෙරට මිත්‍ර රාජ්‍යයන් ලෙස ඉතා සමීපව කටයුතු කිරීමටද එකඟතාව පළ කෙරිණි.

සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දක්වා ඇති පරිදිම දූෂණයෙන් තොර සහ නිවැරදි රාජ්‍ය පාලනයක් බිහිකිරීමට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා අවධානය යොමු කිරීම පිළිබඳව සිය ප්‍රශංසාව පළ කළ ජපාන තානාපතිවරයා, එම වැඩපිළිවෙළ සඳහා ජපානයේ පූර්ණ සහයෝගය ලබා දෙන බවට ද සහතික විය.

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA) පුළුල් කිරීම සහ භෞමික රූපවාහිනී විකාශන ඩිජිටල්කරණ ව්‍යාපෘතිය වැනි ජයිකා අරමුදල යටතේ ආරම්භ කර ඇති ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර පිළිබඳව ද තානාපතිවරයා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාව දැනුම්වත් කළේය.

එසේම ශ්‍රී ලංකාව සහ ජපානය අතර පවතින දිගුකාලීන මිත්‍රත්වය තවදුරටත් තහවුරු කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලාංකිකයන් සඳහා ජපන් භාෂාව හැදෑරීමට සහ ජපානයේ රැකියා සඳහා අවස්ථා සලසා දීමට සහාය වන බවට ද ජපාන තානාපති මිසුකොෂි හිදෙයාකි මහතා ජනාධිපතිවරයා හමුවේ සහතික විය.

ඩෙංගු මර්දනයට ශ්‍රී ලංකාව දරන උත්සහයට කියුබානු රජය සහාය දෙනවා

ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති

ඩෙංගු මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයට කියුබානු රජය අඛණ්ඩව සහාය දෙන බව ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති අන්ද්‍රේස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගොරිඩෝ මහතා (Andres Marcelo Gonzales Gorrido) ජනාධිපති කාර්යාලයේදී ඊයේ (02) පෙරවරුවේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා හමුවේ ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති අන්ද්‍රේස් මාර්සෙලෝ ගොන්සාලෙස් ගොරිඩෝ මහතා (Andres Marcelo Gonzales Gorrido) සහ ජනාධිපතිවරයා අතර පැවැති මෙම සුහද හමුවේදී දෙරට අතර පවතින දීර්ඝ කාලීන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සහ මිත්‍රත්වය ශක්තිමත් කර ගැනීම පිළිබඳව විශේෂ අවධානය යොමු කෙරිණි.

පසුගියදා පැවති ජනාධිපතිවරණයෙන් ලබාගත් ජයග්‍රහණය පිළිබඳව මෙම සුහද සාකච්ඡාවේදී කියුබානු තානාපතිවරයා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා වෙත සිය උණුසුම් සුබපැතුම් පිරිනැමීය. එමෙන්ම ජනාධිපතිවරයාගේ නායකත්වය පිළිබඳ ප්‍රශංසා කළ මෙරට කියුබානු තානාපතිවරයා, ශ්‍රී ලංකාව සමඟ පවතින සහයෝගිතාව වැඩි දියුණු කිරීමට කියුබාව සූදානමින් සිටින බවද ප්‍රකාශ කළේය.

එමෙන්ම, ඩෙංගු මර්දනය සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන් සඳහා කියුබානු රජය අඛණ්ඩව සහාය ලබා දෙන බව මෙහිදී සහතික විය. ඩෙංගු උවදුර මර්දනය කිරීමේදී කියුබාව ලබා ඇති සාර්ථකත්වය පිළිබඳ මෙහිදී පෙන්වා දුන් මෙරට කියුබානු තානපතිවරයා, ශ්‍රී ලංකාව තුළ ඩෙංගු උවදුර තුරන් කිරීම අරමුණු කරගත් මහජන සෞඛ්‍ය වැඩසටහන් සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම බෙදාහදා ගැනීමට සහ සහයෝගයෙන් කටයුතු කිරීමට කියුබානු රජය කැමැත්තෙන් පසුවන බව ද සඳහන් කළේය.

ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා ආයෝජන ප්‍රවර්ධනයට කැපවෙනවා

ඕස්ට්‍රේලියා මහකොමසාරිස් ජනපතිට කියයි

ශ්‍රී ලංකාව තුළ සෘජු විදේශ ආයෝජන (FDIs) ප්‍රවර්ධනය කිරීමට ඕස්ට්‍රේලියාව උනන්දුවෙන් පසුවන බව ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියා මහකොමසාරිස් පෝල් ස්ටීවන්ස් මහතා (Paul Stephens) ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා හමුවේ ඊයේ (02) පැවසීය. මහකොමසාරිස්වරයා සහ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා හමුවක් ජනාධිපති ලේකම් කාර්යාලයේදී ඊයේ (02) පෙරවරුවේ පැවැති අවස්ථාවේ මේ බව අවධාරණය කෙරිණි.

මෙහිදී පසුගියදා පැවති ජනාධිපතිවරණයෙන් ජනාධිපතිවරයා ලබාගත් ජයග්‍රහණය පිළිබඳව ඕස්ට්‍රේලියානු රජයේ උණුසුම් සුබපැතුම් පිරිනැමූ එරට මහකොමසාරිස්වරයා, ශ්‍රී ලංකාව සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම වෙනුවෙන් කැපවී සිටින බව ද ප්‍රකාශ කළේය. සමුදීය ආරක්ෂාව, දේශසීමා පාලනය සහ ත්‍රස්ත විරෝධී ප්‍රයත්නයන් ඇතුළු ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා ශ්‍රී ලංකාවට ඕස්ට්‍රේලියානු රජයේ අඛණ්ඩ සහාය ලබාදෙන බවට මහකොමසාරිස්වරයා මෙම හමුවේදී සහතික විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කර ඇති වැඩසටහනට ද ඕස්ට්‍රේලියාවේ සහාය හිමිවන බවත්, ශ්‍රී ලංකාව තුළ සෘජු විදේශ ආයෝජන (FDIs) ප්‍රවර්ධනය කිරීමට ඕස්ට්‍රේලියාව උනන්දුවෙන් පසුවන බවත් මහකොමසාරිස්වරයා මෙහිදී සඳහන් කළේය.

එමෙන්ම ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා තීරණාත්මක අංගයක් ලෙස ආර්ථිකයේ විනිවිදභාවය පවත්වා ගැනීමේ වැදගත්කම ද ඔස්ට්‍රේලියානු මහකොමසාරිස් පෝල් සිටීවන්ස් මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

ජනාධිපතිවරයාගේ ආරක්ෂක වැඩසටහනට පූර්ණ සහාය දෙනවා

ශ්‍රී ලංකාවේ කැනේඩියානු මහකොමසාරිස්

ජනාධිපතිවරයාගේ දූෂණ විරෝධී සහ ආරක්ෂක වැඩසටහනට මෙන්ම IMF සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට සහාය ලබාදෙන බව ශ්‍රී ලංකාවේ කැනේඩියානු මහ කොමසාරිස් එරික් වොල්ෂ් (Eric Walsh) මහතා පැවසීය.

ශ්‍රී ලංකාවේ කැනේඩියානු මහ කොමසාරිස්වරයා එසේ ප්‍රකාශ කළේ, ඊයේ (02) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා හමුවෙමිණි.

පසුගිය ජනාධිපතිවරණයේ දී අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ලැබූ ජයග්‍රහණය වෙනුවෙන් තමාගේත්, කැනේඩියානු රජයේත්, ජනතාවගේත් උණුසුම් සුබ පැතුම් පිළිගැන්වූ මහ කොමසාරිස්වරයා දූෂණය පිටුදැකීම සහ රට තුළ සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම උදෙසා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ කැපවීම අගය කළේය.

දූෂණය සහ අනාරක්ෂිත බව විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා බලපානු ලබන ප්‍රධාන බාධාවන් බවද මෙහිදී පෙන්වා දුන් එරික් වොල්ෂ් මහතා යෝජිත ප්‍රතිසංස්කරණ සමඟ ජාත්‍යන්තර ආයෝජන ආකර්ශනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ වඩාත් සුදුසු පරිසරයක් නිර්මාණය වනු ඇති බවට ද විශ්වාසය පළ කළේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධ වීම සහ දැනට ක්‍රියාත්මක ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා කැනේඩියානු රජයේ පූර්ණ සහාය ලබා දෙන බවට ද මහකොමසාරිස්වරයා මෙහිදී සහතික විය.

ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට චීනය කැපවී සිටිනවා

චීන තාතාපති ජනපතිට සහතික වෙයි



ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය සඳහා පූර්ණ සහාය ලබා දීමට චීනය සහතික වෙයි.

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සහ ශ්‍රී ලංකාවේ මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති කී සෙන්හොංග් (Qi Zhenhong) මහතා අතර හමුවක් ඊයේ (02) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේදී සිදු වූ අතර එහිදී මේ බව අනාවරණය විය. ජනාධිපතිවරණ ජයග්‍රහණය පිළිබඳව අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා වෙත සිය හෘදයාංගම සුබ පැතුම් පිරිනැමූ තානාපතිවරයා, ශ්‍රී ලංකාවේ ඉදිරි කටයුතු සඳහා චීනය අඛණ්ඩව සහාය දක්වන බවත්, ශ්‍රී ලංකාව සමඟ පවතින ද්විපාර්ශ්වික සබඳතා වැඩි දියුණු කර ගැනීම වෙනුවෙන් චීන රජය අඛණ්ඩව කැපවී සිටින බවත් ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාව තුළ මේ වන විට ක්‍රියාත්මක සහයෝගිතා ව්‍යාපෘතිවල වැදගත්කම හා ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යයන් සඳහා සහාය දැක්වීම සඳහා චීන සංවර්ධන බැංකුව (CDB) සහ EXIM බැංකුවේ ක්‍රියාකාරී මැදිහත්වීම පිළිබඳව ද මෙහිදී ඔහු විසින් අවධාරණය කෙරිණි.

ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා සහාය දැක්වීම වෙනුවෙන් ප්‍රධාන වාණිජ සහ ද්විපාර්ශ්වික ණය ලබා දෙන්නන් ලෙස ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පූර්ණ සහාය ලබා දෙන බවට ද තානාපතිවරයා මෙහිදී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා වෙත සහතික විය.

රාජ්‍යතාන්ත්‍රික සබඳතා තවදුරටත් තහවුරු කර ගැනීමට කැප වෙනවා

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් ජනපතිට සහතික වෙයි

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩපිළිවෙළ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍ය රජයේ සහයෝගය ලබා දෙන බව ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් ඇන්ඩෘ පැට්‍රික් මහතා (Andrew Patrick) ඊයේ (02) ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා හමුවෙමින් සඳහන් කර ඇත.

අනුර කුමාර දිසානායක මහතාගේ නායකත්වය පිළිබඳව ප්‍රසාදය පළ කෙරෙන III වැනි චාල්ස් රජුගේ සහ බ්‍රිතාන්‍ය අගමැති ශ්‍රීමත් කීර් ස්ටාර්මර් (Sir Keir Starmer) මහතාගේ පුද්ගලික සුබ පැතුම් ද ඔහු ජනාධිපතිවරයා වෙත පිළිගන්වන ලදී. දෙරට අතර ශක්තිමත් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තවදුරටත් තහවුරු කර ගැනීමේ වැදගත් පියවරක් සනිටුහන් කරමින් මෙම හමුව සිදු වූ අතර පසුගිය ජනාධිපතිවරණයේ දී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා ලබා ගත් ජයග්‍රහණය වෙනුවෙන් බ්‍රිතාන්‍ය මහකොමසාරිස්වරයා මෙහිදී සිය සුභාශිංසන පිළිගැන්වීය. එසේම ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා ලෙස අනුර කුමාර දිසානායක මහතාගේ ඉදිරි පාලනය වෙනුවෙන් බ්‍රිතාන්‍ය රජයේ සුබ පැතුම් ද මහ කොමසාරිස්වරයා එක් කළේය.

සෘජු විදේශ ආයෝජන (FDIs) ආකර්ශනය කර ගැනීමේ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන් සඳහා බ්‍රිතාන්‍ය රජයේ නොමඳ සහයෝගය ලබා දෙන බව ද ප්‍රකාශ කළ මහ කොමසාරිස්වරයා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාවයේ වැදගත්කම පිළිබඳව ද අවධාරණය කළේය.

ළමා දින සැමරුම් උත්සවයකට අගමැතිනිය එක්වෙයි

නෙත්මි පූජනී රත්නායක

ලෝක ළමා දිනයට සමගාමීව සංවිධාන වූ ළමා දින සැමරුම් උත්සවයක් අගමැති හරිනි අමරසූරිය මෙනෙවියගේ ප්‍රධානත්වයෙන් නාගානන්ද විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පෙරේදා (01) පැවැත් වුණි.

මෙහිදී දූ දරුවන්ගේ දක්ෂතා විදහා දැක්වූ විවිධ ප්‍රදර්ශන කූටි, උපදේශනාත්මක වැඩසටහන්, විනෝද ක්‍රීඩා සහ තරග ආදී වැඩසටහන් රැසක් සංවිධාන කර තිබීම විශේෂත්වයක් විය.

නාගානන්ද විශ්වවිද්‍යාලයේ උපකුලපති ආචාර්ය බොදාගම චන්දිම නාහිමි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර, ළමා හා කාන්තා කාර්යංශයේ නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර, එම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු මහත්ම, මහත්මීන් දෙමාපියන්, දූ දරුවන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාව සඳහා සහභාගි වූහ.